# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No — 2171635 10120

ෆැක්ස්<br>தொலைநகல<br>Fax — 011-

දුරකථන<br>தொலைபேசி<br>Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site — www.Police.lk

ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail — dir.media@police.gov.lk


මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO — 1177/ 2024

ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No — / 2024

දිනය<br>திக<br>Date — 17/07/2024 පැය 0535

## මාධ්‍ය නිවේදනය

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.**

2024.07.16 වන දින සවස් කාලයේ මෝදර පොලිස් වසමේ අලුත් මාවත ප්‍රදේශයේදී කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 01 ග්‍රෑම් 76 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන මෝදර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමර්ශන අංශය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය.**

2024.07.16 වන දින උදෑසන කාලයේ පැලියගොඩ පොලිස් වසමේ නෙල්ලිගහවත්ත පාලම ආසන්නයේදී බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 55 මිලිග්‍රෑම් 300 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නිට්ටඹුව පොලිස් ස්ථානය.**

2024.07.16 වන දින සවස් කාලයේ නිට්ටඹුව පොලිස් වසමේ කෝන්ගස්දෙනිය හන්දිය ප්‍රදේශයේදී නිට්ටඹුව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 30 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන වේයන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

නිට්ටඹුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. හෙරොයින්, ගංජා සහ ජීව උණ්ඩ දෙකක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - තණමල්විල පොලිස් ස්ථානය.

2024.07.16 වන දින සවස් කාලයේ තණමල්විල පොලිස් වසමේ සර්වෝද පාර ප්‍රදේශයේදී තණමල්විල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 670 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන **සිදුකළ** වැඩිදුර **විමර්ශනයේදී සැකකරුගේ නිවසේ කාමරයක තිබී කඩදාසි වල ඔතන ලද පැකට් 06 ක තිබූ ගංජා ග්‍රෑම් 40 ක්, බෝර 12 වර්ගයේ ජීව උණ්ඩ 02 ක් සහ මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගන්නා ලද බවට සැකකරනු ලබන රුපියල් 17640/= ක් සොයාගෙන** ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වන තණමල්විල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තණමල්විල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. විදුලිසැර වැදී පුද්ගලයකු මියයාමක් - බදුල්ල පොලිස් වසම.

2024.07.16 වන දින සවස් කාලයේ බදුල්ල පොලිස් වසමේ වියදිගුන, විනීතගම ප්‍රදේශයේදී පුද්ගලයකුට විදුලිසැර වැදීමෙන් මියගොස් ඇති බවට වැල්ලවාය පොලිසියට ලද පණිවිඩයක් සම්බන්ධයෙන් බදුල්ල පොලිස් ස්ථානය විසින් විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මියගිය පුද්ගලයා වයස අවුරුදු 78 ක් වූ වියදිගුන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම පුද්ගලයා ඔහුගේ ගෙවත්තේ වගාකර ඇති භෝග වටා අනවසර විදුලි රැහැනක් ඇද ඇති අතර එම විදුලි රැහැන් සකස්කිරීමට යාමේදී මෙම පුද්ගලයාට විදුලි සැර වැදී මියගොස් ඇති බව සිදුකල විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත දේහය සම්බන්ධ මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදුකිරීමට නියමිත අතර සිද්ධිය සම්බන්ධව බදුල්ල පොලිසිය විමර්ශන සිදුකරනු ලබයි.

## 06. පුරාවස්තු ලබා ගැනීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු හා හිමිනමක් අත්අඩංගුවට - විශේෂ කාර්ය බලකා කඳවුර කැබිතිගොල්ලෑව.

2024.07.16 වන දින සවස් කාලයේ හොරොව්පොතාන පොලිස් වසමේ මොරවැව ප්‍රදේශයේ පුරාවස්තු ලබා ගැනීමේ අරමුණින් කැණීම් කරන බවට පොලිස් විශේෂ කාර්ය බලකා කැබිතිගොල්ලෑව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **කැණීම් උපකරණ, පූජා භාණ්ඩ සමඟ**

**සැකකරුවන් සිව් දෙනෙකු** අත්අඩංගුවට ගෙන හොරොව්පොතාන පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 23 සහ 42 වයස්වල පසුවන මොරවැව ප්‍රදේශයේ පදිංචිකරුවන් වන අතර සැකකාර හිමිනම අම්බලන්ගොඩ ප්‍රදේශයේ විහාරස්ථානයක වැඩ වසන හිමිනමකි.**

හොරොව්පොතාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - ගල්ගමුව පොලිස් වසම.

2024.07.16 වන දින උදෑසන කාලයේ ගල්ගමුව පොලිස් වසමේ ගල්ගමුව ආණමඩුව මාර්ගයේ පළුකන්දෑව ප්‍රදේශයේදී ආණමඩුව දෙස සිට ගල්ගමුව දෙසට ධාවනය වූ කාර් රථයක් ඊට ප්‍රතිවිරුද්ධ දිසාවෙන් පැමිණි යතුරුපැදියක ගැටී අනතුරක් සිදු ව ඇත. අනතුරින් යතුරුපැදිකරු බරපතල තුවාල ලබා ගල්ගමුව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු ව මිය ගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 19 ක් වූ පළුකන්දෑව, ගල්ගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ගල්ගමුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කාර් රථයේ රියදුරු වශයෙන් කටයුතු කළ කාන්තාව අත්අඩංගුවට ගෙන ඇති අතර ගල්ගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**